# පුරප්පාඩු දැන්වීමයි.

## අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සබරගමුව පළාත් සභාව.

**ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරු සඳහා තෝරා පත් කර ගැනීම - 2024.**

සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ දැනට පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම් ඇති නිලධාරීන්ගෙන් දීප ව්‍යාප්තව අයදුම්පත් කැඳවනු ලැබේ.

| | පුරප්පාඩුව පවතින තනතුර | අනුමත ශ්‍රේණිය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 02 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (බලංගොඩ) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 03 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (කෑගල්ල) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |
| 04 | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ (ඇඹිලිපිටිය) | ශ්‍රී.ලං.අ.ප.සේ I | 01 |

## 02. සුදුසුකම්

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I වන ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

II. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පූර්වාසන්න වසර 05 තුළ කිසිඳු විනයානුකූල දඬුවමකට යටත් නොවූ අයෙකු විය යුතු අතර, කිසිදු ආකාරයක විනය කටයුත්තක් පවතින හෝ එවැනි කටයුත්තකට භාජනය වීමට නියමිත අයෙකු නොවිය යුතුය.

III. අයදුම්පත් භාරගනු ලබන අවසන් දිනට පූර්වාසන්න වසර 05ක් තුළ නියමිත පරිදි සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු අතර, සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය වන **2024.10.30** වන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා වන අදාල සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

## 03. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය

I. අයදුම්කරුවන් විසින් මේ සමඟ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත නිසි පරිදි සම්පූර්ණ කර, **2024.10.30** වන දින හෝ ඊට පෙර දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මගින් (සබරගමුව පළාතේ අයදුම්කරුවන් හැර අනෙකුත් පළාත් සභාවල අයදුම්කරුවන් අදාළ පළාත් අමාත්‍යාංශ ලේකම්ගේ හා ප්‍රධාන ලේකම්ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතු වේ). **"ලේකම්, අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය.

II. එසේම තනතුරු කිහිපයකට ඉල්ලුම් කරනු ලබන්නේ නම්, ආදර්ශ අයදුම්පත්‍රයේ අනු අංක 01 යටතේ ඉල්ලුම් කරන තනතුරු ප්‍රමුඛතාවය අනුපිළිවෙලට සඳහන් කළ යුතුය. අයදුම්පත් බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ තනතුරු සඳහා නිලධාරීන් තෝරා පත් කර ගැනීම"** යනුවෙන් සඳහන් කොට තිබිය යුතුය.

III. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාදවීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් සබරගමුව පළාත් අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් භාර ගනු නොලැබේ. (ආදර්ශ අයදුම්පත www.moe.sg.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය).

## 04. තෝරා ගන්නා ක්‍රමවේදය :-

I. මේ සමඟ දක්වා ඇති ඉහත අංක 02 ඡේදයේ සඳහන් සුදුසුකම් සම්පූර්ණ කරන ලද අයදුම්පත් සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර, **ජ්‍යෙෂ්ඨතාවය හා කුසලතාවය මත පදනම්ව ලකුණු ලබා දෙනු ලැබේ.** එම ලකුණු මත පදනම්ව ඉහළම ලකුණු ලබා ගත් නිලධාරියා / නිලධාරීන් අදාළ තනතුරු සඳහා තෝරා පත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ. (ආදර්ශ අයදුම්පත්‍රය හා ලකුණු ලබා දීමේ ක්‍රමවේදය www.moe.sg.gov.lk වෙබ් අඩවියෙහි පළ කර ඇත.)

***සටහන : සුදුසුකම් සනාථ කරන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්, ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් ද අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.***

II. කෙසේ වෙතත් අයදුම්පත් යොමු කිරීමේ දී අයදුම්කරුවන්ට තම මනාපය පරිදි පුරප්පාඩු තනතුරු නම් කළ හැකි අතර, එම තනතුරුවලට පත් කිරීමේදී එම මනාපයද සළකා බලනු ලැබේ.

**05.** මෙහිදි තනතුරු කිහිපයකට ඉල්ලුම් කල හැකි නමුත්, පවත්වනු ලබන විධිමත් සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු ද සැලකිල්ලට ගෙන ඉහත තනතුරු සඳහා තේරීපත් වන නිලධාරීන් එම පුරප්පාඩු සඳහා තෝරා පත් කිරීම, ස්ථානගත කිරීම හා පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට අදාළ සියලු කටයුතු සම්බන්ධයෙන් සබරගමුව පළාත් අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

**06.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

**බී.ඒ.සී.පී. බමුණුආරච්චි,**
**ලේකම්,**
**අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,**
**සබරගමුව පළාත් සභාව.**

**2024.10.01**